# ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ අපනයන හා ආනයන ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයන වාර්තාව









මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

නදීකා හේරත්
මානව සම්පත් සංවර්ධන සහකාර

# ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ අපනයන හා ආනයන ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයන වාර්තාව

## 01. හැඳින්වීම.

නිදහස ලබා ගැනීමට පෙර සහ ඉන් පසුවත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිෂ්පාදන අංශය ලෙස ගොඩනැගෙමින් පැවතියේ කෘෂිකාර්මික අංශයයි. වී නිෂ්පාදනය මත පදනම් වූ කෘෂිකර්මාන්තය, තේ, රබර්, පොල් මත පදනම් වූ වාණිජ භෝග වගාවන් දක්වා පරිවර්තනය විය. මෙකී නිෂ්පාදන අංශයන් විශේෂීකරණය වීමේදී ඒවායේ සාපේක්ෂ දායකත්වය ආර්ථික වර්ධනය සඳහා ප්‍රමාණවත්ද යන්න අධ්‍යනය කිරීම කාලෝචිත වේ. 1970 – 1972 කාලපරිච්ඡේදය තුළ ආවෘත ආර්ථිකයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් ආර්ථිකය දරුණු ලෙස පසුබෑමකට ලක්විය. සාමාන්‍ය වාර්ෂික වර්ධනය 2.8% ක තරම් අඩු මට්ටක පැවතිණි. පසුව 1977 විවෘත ආර්ථිකයට පරිවර්තනය වීමත් සමඟ සියළු වෙළඳ සීමා ඉවත් වී වෙළඳපොළ ඉල්ලුම සහ සැපයුම මත මිල තීරණයවන තත්වයක් නිර්මාණය විය. ඒ අනුව පෞද්ගලික අංශයේ මැදිහත්වීම සහිත අපනයන පෙරදැරි කරගත් කර්මාන්තවලට ප්‍රමුකස්ථානය ලබා දෙන කාර්මික ප්‍රතිපත්ති ප්‍රකාකාශයක් 1995 වන විට ප්‍රකාශයට පත්විය. ( ශ්‍රී ලංකා මහ බැංකුව 1998 - 137)

## 02. ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය , ආනයනය සහ සේවා අපනයනය

ශ්‍රී ලංකාවේ අපනයන යන්න මගින් ආවරණය වන්නේ කෘෂිකාර්මික අපනයන කාර්මික අපනයන ඛනිජ ද්‍රව්‍ය අපනයන හෝ වර්ග නොකල අපනයන වේ. කෘෂිකාර්මික අපනයන යටතේ තේ, පොල්, රබර් ආදිය ද කාර්මික අපනයන යටතට ආහාර පාන වර්ග ද දුම්කොළ , රෙදි පිළි සහ ඇඟළුම් යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය ද ඛනිජ ද්‍රව්‍ය අපනයන යටතේ මැණික් හා වෙනත් ඛනිජ ද්‍රව්‍ය අපනයන ද ඇතුලත් වේ. ආනයනය මඟින් ආවරණය වන්නේ පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ, වර්ග නොකල භාණ්ඩ යන්නයි.

සේවා අංශය මඟින් ආවරණය වන්නේ සංචාරක, ප්‍රවාහන, ඉදිකිරීම්, රක්ෂණ සහ විශ්‍රාම වැටුප්, මූල්‍ය සේවා, විදුලි සංදේශ සහ පරිගණක සේවා සහ වෙනත් ව්‍යාපාරික සේවා යන්නයි.

- **භාණ්ඩ අපනයන සංයුතිය**

  a. කෘෂිකාර්මික අපනයන

  තේ, පොල්, රබර්, කුළුබඩු, එළවළු, සකස් නොකළ දුම්කොළ, සුළු කෘෂිකාර්මික නිශ්පාදන, මුහුදු ආහාර

b. කාර්මික අපනයන

රෙදිපිළි හා ඇඟළුම්, රබර් නිශ්පාදිත, ඛනිජ තෙල් නිශ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ආහාර පාන වර්ග හා දුම්කොළ, යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍ර සූත්‍ර උපකරණ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, පිඟන් මැටි නිෂ්පාදිත, අනෙකුත් කාර්මික අපනයන

c. ඛනිජමය අපනයන

මැණික් හා වෙනත් ඛනිජ ද්‍රව්‍ය

d. වර්ග නොකල අපනයන

- **භාණ්ඩ ආනයන සංයුතිය**

a) පාරිභෝගික භාණ්ඩ

ආහාර හා පාන වර්ග (සහල්, සීනි හා රස කැවිලි, කිරි නිශ්පාදිත, පරිප්පු, වෙනත්)

ආහාරමය නොවන භාණ්ඩ වර්ග (රථ වාහන, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, ගෘහ උපකරණ, රෙදිපිළි හා උපාංග, වෙනත්)

b) අන්තර් භාණ්ඩ

ඉන්ධන, රෙදිපිළි හා උපාංග, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ, රසායනික නිශ්පාදන, තිරිඟු හා ඉරිඟු, පොහොර, අනෙකුත් අන්තර් භාණ්ඩ

c) ආයෝජන භාණ්ඩ

ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, අනෙකුත් ආයෝජන භාණ්ඩ

d) වර්ග නොකළ ආනයන

- සේවා අංශයේ සංයුතිය

a) සංචාරක

b) ප්‍රවාහන

මුහුදු ප්‍රවාහන කුලී නැව්, ගුවන් ප්‍රවාහන මගී ගාස්තු, ගුවන් කුලී,

c) විදුලි සංදේශ හා සහ පරිගණක සේවා

d) රක්ෂණ සහ විශ්‍රාම වැටුප්


e) ඉදිකිරීම්

f) වෙනත් ව්‍යාපාරික සේවා

# ශ්‍රී ලංකාවේ අපනයනය සහ ආනයනය

## 2018 වසරේ දී


ඇමරිකානු ඩොලර් මිලියනවලින්



**සමස්ථ අපනයන**

**වටිනාකම** **11,890**


| | |
|---|---|
| කෘෂි කාර්මික අපනයන | 2579.3 |
| කාර්මික අපනයන | 9258.2 |
| ඛණිජ අපනයන | 34.4 |
| වර්ග නොකළ අපනයන | 17.8 |





**සමස්ථ ආනයන**

**වටිනාකම** **22,233**

| | |
|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 4979.7 |
| අන්තර් භාණ්ඩ | 12488.0 |
| ආයෝජන භාණ්ඩ | 4690.4 |
| වර්ග නොකළ ආනයන | 74.6 |



*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*


# ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය

## 2017 වසරේ දී

**සමස්ථ අපනයනය**

ඇමරිකානු ඩොලර් මිලියන

**11360**





## 2018 වසරේ දී

**සමස්ථ අපනයනය**

ඇමරිකානු ඩොලර් මිලියන

**11890**




කාර්මික අපනයන වටිනාකම 8541.9

කෘෂිකාර්මික අපනයන වටිනාකම 2767.2

කාර්මික අපනයන වටිනාකම 9258.2

කෘෂිකාර්මික අපනයන වටිනාකම 2579.3


**වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන 529.2**

*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*

# ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය

## 2017 වසරේ දී


ඇමරිකානු ඩොලර් මිලියනවලින්





- ☆ පාරිභෝගික භාණ්ඩ
- ☆ අන්තර් භාණ්ඩ
- ☆ ආයෝජන භාණ්ඩ
- ☆ වර්ග නොකළ ආනයන

## 2018 වසරේ දී

ඇමරිකානු ඩොලර් මිලියනවලින්




- ☆ පාරිභෝගික භාණ්ඩ
- ☆ අන්තර් භාණ්ඩ
- ☆ ආයෝජන භාණ්ඩ
- ☆ වර්ග නොකළ ආනයන




*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*


# ශ්‍රී ලංකාවේ සේවා අපනයනය (සේවා වෙළදාම) .

## 2017 වර්ෂයේදී

### සමස්ත සේවා අපනයනය

එ.ජ. ඩොලර් මිලියන





## 2018 වර්ෂයේදී

### සමස්ත සේවා අපනයනය

එ.ජ. ඩොලර් මිලියන








*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*

## 03. ශ්‍රී ලංකාවේ භාණ්ඩ ආනයනය, අපනයනය හා සේවා අපනයනයේ වෙනස් වීම වාර්ෂිකව ( එ.ජ.ඩොලර් මිලියන)

| | 2014 | 2015 | 1016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| භාණ්ඩ අපනයන ආදායම | 11,130 | 10,505 | 10,310 | 11,360 | 11,890 |
| භාණ්ඩ ආනයන අදායම | 19,417 | 18,935 | 19,400 | 20,980 | 22,233 |
| සේවා අපනයන ආදායම | 5,605 | 6,397 | 7,138 | 7,724 | 8,374 |

*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*




ඉහත වගුවෙන් සහ රූප සටහන මඟින් වාර්ෂිකව භාණ්ඩ අපනයන , ආනයන සහ සේවා අපනයන ආදායමෙහි වාර්ෂික වෙනස්වීම් සිදුවී ඇති ආකාරයයි. ඒ අනුව සේවා අපනයනය වාර්ෂිකව වැඩිවෙමින් පවත්වාගෙන ඇති අතර භාණඩ අපනයන සහ ආනයන ආදායම 2014 දී තිබූ තත්වයෙහි අඩු වීමක් 2015/16 වර්ෂවලදී දක්නට ලැබේ. එසේ වුවද 2017 වර්ෂයේ සිට නැවත එහි වර්ධනයක් පෙන්නුම් කරයි.


## 04. ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන වෙළඳ දිශාව

ආනයන වෙළඳ දිශාව පිළිබඳ සලකා බැලීමේදී පෙනී යන මූලික කරුණක් වන්නේ නිදහස ලැබූ මුල් අවධියේ ආනයනය කර ඇති රටවල් වන ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපා සංගමය වැනි රටවල් වලට අමතරව මෑත කාලීනව එකතු වූ රටවල් රාශියකින් ආනයනය කරනු ලබන බවයි.

ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳ දිශාව නිදහස ලැබූ මුල් කාලයේ සිට වර්තමානය දක්වා සැලකිය යුතු වෙනසක් සිදු නොවී ඇති බවයි. එනම් මුල් අපනයන හවුල් කරුවන් එලෙසම ක්‍රියාත්මක වෙමින් පවතී.

පහත රූප සටහන මඟින් ආනයන හා අපනයන ගමනාන්තයන් කිහිපයක් පෙන්නුම් කරයි.

## 05. ශ්‍රී ලංකාවේ ආනයන අපනයන ගමනාන්තයන්




| අපනයනය (%) 2018 | |
|---|---|
| යුරෝපා සංගමය(EU) | 29 |
| ඇමරිකා එක්සත් ජනපදය | 25.9 |
| එක්සත් රාජධානිය | 8.2 |
| ඉන්දියාව | 6.5 |
| ජර්මනිය | 5 |

| ආනයනය (%)2018 | |
|---|---|
| යුරෝපා සංගමය | 9 |
| ඉන්දියාව | 19 |
| චීනය | 18.5 |
| එක්සත් අරාබි එමීර් | 8.3 |
| ජපානය | 7.1 |

*මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව*

## 06. නිගමන

- භාණ්ඩ අපනයනය

  දළ දේශීය නිශ්පාදනයට වැඩි දායකත්වයක් සැපයූ නිෂ්පාදන අංශයක් ලෙස වී වගාව මූලිකත්වය ගෙන තිබූ අතර යටත් විජිත යුගයේදී තේ, පොල්, රබර් යන වාණිජ බෝග දක්වා නිෂ්පාදන අංශය විතැන් විය. පසුව හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්තීන් (විවෘත්ත ආර්ථික ප්‍රතිඵත්තිය) කාර්මික අංශයේ වර්ධනය සඳහා හේතු විය. ඒ අනුව කෘෂි අංශය මඟින් දළ දේශීය නිෂ්පාදනයට දැක්වූ දායකත්වය අභිබවා යාමට කාර්මික අංශය සමත් වී ඇත.

- භාණ්ඩ ආනයනය

ජාත්‍යන්තර වෙළදාමේ දී රටේ දේශීය නිෂ්පාදනයේ දී සාපේක්ෂ වශයෙන් අවාසි සහගත භාණ්ඩ ආනයනය කිරිම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ආනයනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පෙනී යන කරුණක් වන්නේ මුල් කාලයේදී අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ආනයනය කර ඇති බවයි. පසු කාලීනව වැඩිම ආනයන වියදමක් දරා ඇත්තේ අන්තර් භාණ්ඩ සඳහාවන අතර ඒ තුළ ඛණිජ තෙල් ආශ්‍රිත නිශ්පාදන හා පසුව එය රෙදිපිළි හා ඇඟළුම් ආනයනය දක්වා ද යොමු වී ඇත. ඒ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාව ආනයනය කර ඇත්තේ සාපේක්ෂ ලෙස අවාසි සහගත භාණ්ඩ පමණක්ම නොවන බවයි.

- සේවා අපනයනය

භාණ්ඩ අපනයනය හා අනයනය මගින් දළ දේශීය නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් සැපයුව ද වර්තමානයවන විට සේවා අංශය ද ඒ සඳහා සැලකිය යුතු මට්ටමක දායකත්වයක් සපයන අංශයක් බවට පත්වී ඇත. ඒ අනුව 2018 වර්ෂයේදී සේවා වෙළදාම කැපී පෙනෙන වර්ධනයක් ද පෙන්නුම් කර ඇත. විදේශ ගමන් හා සංචාරක සේවා , ප්‍රවාහන, විදුලි සංදේශ හා පරිගණක සේවා ඒ අතරින් ඉදිරියෙන් ඇති අංශයන් බවට පත්වී ඇත.

## 07. යෝජනා

- භාණ්ඩ අපනයන
  - ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ වෙනස් වීම් ආර්ථික වර්ධනය මූලික කර ගනිමින් ප්‍රමාණවත් මට්ටමකට පැමිණිය යුතු වේ.
  - කාර්මික අංශය ශක්තිමත්වන කාර්මික ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අමුද්‍රව්‍ය ආනයනය පහසු කිරීම, දේශීය කර්මාන්තය මත ආරක්ෂණයක් ඇති කිරීම, දේශීය මූල්‍ය අංශය තුළින් මූල්‍ය පහසුකම් ලබාගත හැකි හා මූල්‍ය ක්ෂේත්‍රය ස්ථායීව තබා ගත හැකි ආකාරයේ ප්‍රතිපත්ති සැකසීම.
  - ක්‍රියාත්මක කළ කාර්මික ප්‍රතිපත්ති තුළ ඉහල දායකත්වයක් හා වර්ධනයක් සපයන නිෂ්පාදන අංශය ලෙසට පත්ව ඇති ඇගළුම් කර්මාන්තය අරමුණු කර ගනිමින් රාජ්‍ය අනුග්‍රහය සංකේන්ද්‍රණය කර වීම.
  - ජාත්‍යන්තර වෙළඳපොළ අරමුණු කර ගනිමින් විශේෂීකරණය කළ හැකි ආකාරයේ අනෙකුත් කාර්මික අංශයන් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

- භාණ්ඩ ආනයන
  - ශ්‍රී ලංකාවේ ආනයනය ප්‍රධාන ලෙස කේන්ද්‍රගත විය යුත්තේ අන්තර්, ආයෝජන හෝ පාරිභෝජන හෝ රටේ දේශීය නිශ්පාදනයේ දී සාපේක්ෂ ලෙස අවාසි සහගත සීමිත භාණ්ඩ ප්‍රමාණයක් සඳහාය.
  - ආනයනය කරන ලද භාණ්ඩ අතරින් දේශීය ලෙස නිෂ්පාදනය කර ගැනීමේ විභවතාවයක් ඇති නිශ්පාදන පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

    උදා :- සහල්, මුං ඇට, අර්තාපල්, සීනි වැනි පාරිභෝගික භාණ්ඩ , පොහොර, රෙදිපිළි හා ඇඟළුම් ආදී භාණ්ඩ සඳහා ඉහළ අගයක තීරු බද්දත් පැනවිය යුතු මෙන්ම ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා පෙළඹවීම් ඇති කිරීමද සිදුකළ යුතුවෙයි.

- සේවා අපනයන
  - සේවා අංශයේ අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රවාහන සේවාව නැංවීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සිදුකළ යුතු අතර, මුහුදු හා ගුවන් සේවා නැංවීම ඒ අතරින් ප්‍රධාන වේ.
  - ශ්‍රී ලංකාවේ සුන්දරත්වය සහ සුවිශේෂත්වය පිළිබඳ ලොව හමුවේ ප්‍රචාරණය විය යුතුය. එමඟින් විදෙස් සංචාරකයින් තුළ මෙරට සංචාරක කර්මාන්තය පිළිබඳ විශ්වාසයක් සේම විශේෂ කැමැත්තක් ඇති කරවිය හැක. එමෙන්ම ශ්‍රී ලංකාව ආරක්ෂිත සේම, සුවදායී පරිසරයකින් යුක්ත සංචාරය සඳහා සුදුසු රටක්ය යන්න ලෝකයට සන්නිවේදනය කිරීමේ වැඩපිළිවෙලක් පවත්වාගෙන යායුතුය. ඒ සඳහා ප්‍රචාරණ නියෝජිත ආයතන ආරම්භ කිරීම සඳහා අවධානය යොමු කළ යුතු වේ.
  - විදුලි සංදේශ සහ පරිගණක සේවා නැංවීම සඳහා නව ප්‍රතිපත්ති සකස් කළ යුතු වෙන අතර, එම තාක්ෂණය පරිශීලන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.